සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 14 - කතෝලික ධර්මය

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 14 - කතෝලික ධර්මය

## අවසාන ලකුණු ගණනය කිරීම

## I ප්‍රශ්න පත්‍රය

බහුවරණ 1 - 40 = 1 x 40 40 = 40

## II ප්‍රශ්න පත්‍රය

**1 ප්‍රශ්නය (අනිවාර්ය)**

1 - 10 දක්වා = 2 x 10 20 = 20

**2 ප්‍රශ්නය** ( 2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

**3 ප්‍රශ්නය**

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

**4 ප්‍රශ්නය**

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

**5 ප්‍රශ්නය**

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

**6 ප්‍රශ්නය**

i කොටස ලකුණු 2
ii කොටස ලකුණු 3
iii කොටස ලකුණු 5 10

**7 ප්‍රශ්නය** - කෙටි සටහන් දෙකක් සඳහා

5 + 5 10

**එකතුව** 04 x 10 = 40

**100**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................ √ △ $\frac{4}{5}$

(ii) ........................................ √ △ $\frac{3}{5}$

(iii) ........................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍ය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍ය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

2018.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශුද්ධ වූ බයිබලය එක පොතක් නොව පොත් සමූහයකින් සමන්විත නිසා එය,
(1) ශබ්ද කෝෂයකි. (2) විවරණයකි. (3) විශ්ව කෝෂයකි. (4) පුස්තකාලයකි.

**2.** කතෝලික ධර්මය පදනම් වී ඇත්තේ,
(1) දේව වචනය මත ය. (2) සභා සම්ප්‍රදාය මත ය.
(3) අපෝස්තලික සම්ප්‍රදාය මත ය. (4) ශුද්ධ වූ සභාව මත ය.

**3.** මිනිස් යටගියාව තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය සනාථ වන්නේ,
(1) සාහිත්‍ය පොත් මගිනි. (2) ප්‍රඥා සාහිත්‍යය මගිනි.
(3) ඉතිහාස පොත් මගිනි. (4) දිවැසි ග්‍රන්ථ මගිනි.

**4.** පහත සඳහන් තොරතුරු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.
A - ඉතිහාසඥයෙකි.
B - වෛද්‍යවරයෙකි.
C - චිත්‍ර ශිල්පියෙකි.
D - පාවුලුතුමාගේ ධර්මදූත චාරිකාවලට සහභාගි වී ඇත.
ඉහත තොරතුරු අනුව සනාථ වන පුද්ගලයා වනුයේ,
(1) ශුද්ධ වූ ජොහන්තුමා ය. (2) ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ පේදුරුතුමා ය. (4) ශුද්ධ වූ බානබස්තුමා ය.

**5.** ගිබියොන්හි ප්‍රධාන කඳු මත පූජාස්ථානයට පූජා ඔප්පු කිරීම පිණිස ගියේ,
(1) දාවිත් රජතුමා ය. (2) හෙරොද් රජතුමා ය.
(3) පිලාත් රජතුමා ය. (4) සලමොන් රජතුමා ය.

**6.** බොහෝදුරට සමාජයේ ප්‍රභූ පන්තිය සඳහා වූ හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේදය වන්නේ,
(1) පවුල හා ගෝත්‍රික ප්‍රඥාවයි. (2) රාජ්‍ය සභා ප්‍රඥාවයි.
(3) අභිධාර්මික ප්‍රඥාවයි. (4) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාවයි.

**7.** ලූක් 19 : 8 අනුව "යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට සතර ගුණයක් ආපසු දෙමි." යැයි ජේසුස් වහන්සේට පැවසුවේ,
(1) පොහොසත් තරුණයා ය. (2) මෝඩ ගබඩාකාරයා ය.
(3) අකීකරු පුත්‍රයා ය. (4) සකේවුස් ය.

**8.** ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන් වෙත වැඩම කර
A - ඔවුන් ශක්තිමත් කළ සේක.
B - ඔවුන් මත හුස්ම හෙලූ සේක.
C - ඔවුන්ට ශුද්ධාත්ම වරම් දානය කළ සේක.
D - ඔවුන්ට පවු කමා කිරීමේ වරම දානය කළ සේක.
ඉහත සඳහන් අවස්ථා සිදු වූයේ,
(1) එම්මාවුස් ගමනේදී ය. (2) සතියේ පළමු දා හිමිදිරි උදෑසන ය.
(3) පාස්කු ඉරු දින සවස ය. (4) ගල් ලෙන අසල ය.

**9.** ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා විසින් රචිත සාහිත්‍ය කෘතීන් අතුරෙන් චතාරික කාලයේදී භාවිත කරන කෘතිය වන්නේ,
(1) දේව වේද පුරාණයයි. (2) වේද කාව්‍යයයි.
(3) මංගල ගීතයයි. (4) පසන් පොතයි.

**10.** ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය වූ මස් කැබැල්ලේත්, වියුරින් නුවර සිරි සළුවේත් එක හා සමාන ලේ වර්ගයක් වන අතර එම රුධිර වර්ගය කුමක් ද?
(1) A (2) B (3) A B පොසිටිව් (4) O පොසිටිව්

**11.** 2005 අප්‍රේල් මස 02 වන දින ස්වර්ගස්ථ වූ මෙතුමා 2011 මැයි මස 01 වන දින භාග්‍යවරයට ද 2014 අප්‍රේල් මස 27 දින ශුද්ධවරයට ද ඔසවන ලද්දේ,
(1) ශුද්ධ වූ II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(2) ශුද්ධ වූ මරියා ගොරෙත්තිතුමිය ය.
(3) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය ය.
(4) ශුද්ධ වූ XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

**12.** කතෝලික සභා ධර්මෝපදේශයට අනුව බොරුවක් සනාථ කිරීමට දෙවියන් වහන්සේගේ නාමය භාවිත කිරීම
(1) දේව අපහාසයකි. (2) දේව උදහසකි.
(3) දේව ශාපයකි. (4) දේව ද්‍රෝහිකමකි.

**13.** පතිව්‍රත සහ පතිනිව්‍රත රැකිය යුත්තේ,
(1) විවාහක ස්වාමි පුරුෂයා ය. (2) විවාහක යුවතිපතීන් ය.
(3) අවිවාහක තරුණ තරුණියන් ය. (4) විවාහක ස්ත්‍රීන් ය.

**14.** යටත් විජිත යුගවල මෙරටට පැමිණි විවිධ පැවිදි නිකායන් අතුරෙන් බ්‍රිතාන්‍ය යුගයේදී මෙරටට පැමිණි පැවිදි නිකාය කුමක් ද?
(1) සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය (2) දොමිනිකාන නිකාය
(3) ඔරතෝරියාන නිකාය (4) ෆ්‍රැන්සිස්කාන නිකාය

**15.** පුරාණ ගිවිසුමේ පළමුවරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළ තැනැත්තා වන්නේ,
(1) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. (2) ආරෝන් ය.
(3) ජෝෂුවා ය. (4) මෙල්කිසදෙක් ය.

**16.** සත්‍යවාදීවීමේ සහ සත්‍යයට සාක්ෂි දැරීම නියම වන්නේ කී වැනි පනතින් ද?
(1) හත්වන (2) අටවන (3) නවවන (4) දහවන

**17.** "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව ලේඛනයේ අංක 20 හි ජනවන්දනාව අර්ථ දක්වන්නේ,
(1) අති උතුම් II වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) අති උතුම් VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(4) අති උතුම් XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.

**18.** ජනවන්දනාව තුළ සතියේ වැදගත්ම දිනය ලෙස සැලකෙන්නේ,
(1) පාස්කු ඉරු දින ය. (2) ණය මංගල්‍ය දින ය.
(3) ඉරු දින ය. (4) ශොබ් ඉරු දින ය.

**19.** පහත සඳහන් දින කතෝලිකයනට වැදගත් වේ.
A - ගොබ් ඉරුදින
B - මහා බ්‍රහස්පතින්දා
C - මහා සිකුරාදා
D - අල්ලේලූයියා සෙනසුරාදා
ඉහත දින අතුරෙන් ශුද්ධ වූ දින තුන සඳහන් වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, D (3) A, C, D (4) B, C, D

**20.** දිව්‍ය පූජාවේ අවසාන ආශිර්වාදයෙන් අපව පිටත් කර යවන්නේ,
(1) ධර්මදූත ක්‍රියාවලියට ය. (2) කිතුනු පවුලට ය.
(3) දහම් පාසලට ය. (4) සහභාගිශීලි සමූහයට ය.

**21.** පංච පුස්තකය රචනාවීම සඳහා දායක වී ඇති ප්‍රධාන දේව ධාර්මික සම්ප්‍රදායන් ගණන
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි.

**22.** පූජකවරුන්ගේ ඉගැන්වීම් ඉදිරිපත් කරන බැවින් ආගමික වතාවත් හා ජනවන්දනාව පිළිබඳව විශේෂ අවධානයක් දී ඇති සම්ප්‍රදාය වන්නේ,
(1) පූජක ය. (2) යාවේ ය. (3) එලොහිම් ය. (4) ද්විතීය නීති ය.

**23.** පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් ද්විතීය සම්මත ග්‍රන්ථ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
A - තෝබිත්
B - හග්ගායි
C - ජුදිත්
D - සෙකරියා
(1) A, B (2) A, C (3) A, D (4) B, D

**24.** ශුද්ධ වූ පේදුරුතුමාගේ භාෂා පරිවර්තකයා වූයේ,
(1) ශුද්ධ වූ මතෙව්තුමා ය. (2) ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ මාර්ක්තුමා ය. (4) ශුද්ධ වූ ජොහන්තුමා ය.

**25.** වරදට වැටුණු මනිසාට දෙවියන් වහන්සේ දඬුවම් කළ ආකාරය පහත සඳහන් උපුටනයන් මගින් දැක්විය හැකි ය.
A - "විලිරුදාව ඇතිව නුඹ දරුවන් ප්‍රසූත කරන්නෙහි ය."
B - "පොළොවෙන් නුඹ නෙරපා දමනු ඇත."
C - "පොළවට ශාප වේවා."
D - "දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහි ය."
ඉහත උපුටනයන් අතුරෙන් කායින්ට දුන් දඬුවම දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**26.** උත්පත්ති 12 : 2 ට අනුව "මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි." යනුවෙන් දෙවියන් වහන්සේ පොරොන්දු වූයේ,
(1) මෝසෙස්ට ය. (2) නෝවාට ය. (3) ආබ්‍රහම්ට ය. (4) ජෝශප්ට ය.

**27.** ස්නාවක ජොහන්තුමාගේ දූත කාර්යය ආරම්භ වූයේ,
(1) කපාල කන්ද අසලින් ය. (2) ජෙරුසලෙම් දේව මාලිගාවෙන් ය.
(3) පාළුකරයේදී ය. (4) ජොර්දාන් ගඟ අවටින් ය.

**28.** ජේසුස් වහන්සේ පරීක්ෂා කළ අවස්ථාවේදී උන්වහන්සේ සාතන්ට පැවසූ වදන් පහත දැක්වේ.
A - "මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය."
B - "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න."
C - "උන්වහන්සේට පමණක් සේවය කරන්න."
D - "නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේ පරීක්ෂා නොකරන්න කියා ලියා ඇත."
ඉහත ප්‍රකාශ අතුරෙන් කොත මුදුනේදී ජේසුස් වහන්සේ වදාළ ප්‍රකාශයට අදාළ අක්ෂරය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

**29.** සුභාරංචි ග්‍රන්ථ තුළ ප්‍රාතිහාර්යයන් සිදුවීමට ප්‍රබල බලපෑමක් ඇති කරන්නේ,
(1) අනුකම්පාව ය. (2) ප්‍රසිද්ධිය ය. (3) ඇදහිල්ල ය. (4) ආයාචනය ය.

**30.** වපුරන්නා පිළිබඳ උපමාවේ "බීජ වැටුණු බිම" පහත දැක්වෙන ආකාරයට දැක්විය හැකි ය.

A - මග දිගේ වැටුණු බීජ
B - පස් නැති ගල් බිමේ වැටුණු බීජ
C - කටු අතර වැටුණු බීජ
D - සරු බිමෙහි වැටුණු බීජ

ඉහත සඳහන් තොරතුරුවලට අනුව කුරුල්ලෝ අහුලාගෙන කෑ බීජ වැටුණු ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**31.** ජේසුස් වහන්සේ භාග්‍ය අට තුළින් ගෙන හැර දැක්වූයේ,

(1) දේව රාජ්‍යයේ වටිනාකම් ය. (2) උපවාසය පිළිබඳ ඉගැන්වීම ය.
(3) දන්දීම පිළිබඳ ඉගැන්වීම් ය. (4) පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකය ය.

**32.** පූජකයෙකු, දිවැසිවරයෙකු හා රජ කෙනෙකු වශයෙන් දෙවියන් වහන්සේට හා මිනිසාට සේවය කිරීමට ආලේප කරනු ලබන සක්‍රමේන්තුව වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනයයි. (2) පූජකවරයයි.
(3) රෝගීන්ගේ ආලේපයයි. (4) අභිවෘද්ධි ආලේපයයි.

**33.** මරියතුමියගේ ස්වර්ගාරෝපණය මංගල්‍යය යෙදෙනුයේ කවදා ද?

(1) ජනවාරි 01 (2) අගෝස්තු 15 (3) මැයි 31 (4) දෙසැම්බර් 08

**34.** රෝගීන්ගේ ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය දානය කිරීමේදී ශුද්ධ වූ තෙලය ආලේප කරනු ලබන්නේ රෝගියාගේ,

(1) නළලෙහි ය. (2) දෑත් සහ ළයෙහි ය. (3) නළල සහ දෑතෙහි ය. (4) දෑතෙහි ය.

**35.** පූජාප්‍රසාදීතුමා සභාවේ නිල සාක්ෂිකරුවා සහ ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරනු ලබන සක්‍රමේන්තුව වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනයයි. (2) අභිවෘද්ධි ආලේපයයි.
(3) රෝගීන්ගේ ආලේපයයි. (4) ආශිර්වාදකාර බන්ධනයයි.

**36.** ක්‍රි.ව. 1833 දී භාග්‍යවන්ත ෆෙඩ්රික් ඕසනාම්තුමා විසින් ආරම්භ කරන ලද්දේ,

(1) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයයි. (2) ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදය සමිතියයි.
(3) මරිය හමුදාවයි. (4) සාන්ත වින්සන් ද පාවුලා සමිතියයි.

**37.** කතෝලික සභා ධර්මෝපදේශය අංක 2797 ට අනුව අප අයදින සියල්ල අපට නොවැරදීම ලැබෙන බවට විශ්වාස කරමින් පරමණ්ඩල යැදුම උච්චාරණය කළ යුත්තේ,

(1) අභිමානයෙන් හා ගෞරවයෙන් ය. (2) බැහැපත්ව හා සතුටින් ය.
(3) භයාධිකව හා පසුතැවිලිව ය. (4) එඩිතරව හා එක්සිත්ව ය.

**38.** "ස්වාමි දරුවන්ගේ සුවිශුද්ධ මෑණියනි" යන යැදුම පැවත එන්නේ ක්‍රිස්තු වර්ෂ කී වන ශත වර්ෂයේ සිට ද?

(1) පළමුවන (2) දෙවන (3) තුන්වන (4) සතරවන

**39.** මරියතුමියගේ උදාන ගීය භාවිත කරනුයේ,

(1) උදායාම යැදුමේදී ය. (2) දිවා යාම යැදුමේදී ය.
(3) සැඳෑ යාම යැදුමේදී ය. (4) රාත්‍රි යාම යැදුමේදී ය.

**40.** ජුදා ජනතාව ධර්මශාලාවල යාච්ඤාව සඳහා භාවිත කළේ,

(1) ගීතාවලියේ ගීතිකායි. (2) එළිදරව් සාහිත්‍යයයි.
(3) ප්‍රඥා සාහිත්‍යයයි. (4) ද්විතීය නීති සංග්‍රහයයි.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 14 | විෂයය<br>பாடம் | කතෝලික ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 01 | 21. | 04 | 31. | 01 |
| 02. | 01 | 12. | 01 | 22. | 01 | 32. | 01 |
| 03. | 03 | 13. | 02 | 23. | 02 | 33. | 02 |
| 04. | 02 | 14. | 01 | 24. | 03 | 34. | 03 |
| 05. | 04 | 15. | 04 | 25. | 02 | 35. | 04 |
| 06. | 02 | 16. | 02 | 26. | 03 | 36. | 04 |
| 07. | 04 | 17. | 02 | 27. | 04 | 37. | 02 |
| 08. | 03 | 18. | 03 | 28. | 04 | 38. | 03 |
| 09. | 04 | 19. | 04 | 29. | 03 | 39. | 03 |
| 10. | 03 | 20. | 01 | 30. | 01 | 40. | 01 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | $\frac{25}{40}$ | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | $\frac{25}{40}$ |
|---|---|---|---|

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## 14 - කතෝලික ධර්මය
## ලකුණුදීමේ පටිපාටිය
## II කොටස

**1. අභිමතාර්ථ: දේව වචනය පදනම් කොටගෙන යහපත් කිතුනු ජීවිතයක් ගත කිරීම හා අධ්‍යාත්මික පෝෂණය ලබා ගැනීම.**

**ලකුණු: (2x10=20)**

**i. පුද්ගලයින් හෝ ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේවවේදී දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇති ජනප්‍රිය ඓතිහාසික කෘති දෙක නම් කරන්න.**

- රූත් කථාව
- එස්තර් ග්‍රන්ථය

**ii. ශුද්ධ වූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමන සඳහා අතරමඟදී සහභාගී කරගත් පුද්ගලයින් දෙදෙනා කවුද?**

- තිමෝසියස්තුමා
- ලූක්තුමා

**iii. පුරාණ ගිවිසුමේ ජෝශප් පෝතිපර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩවන පනත් දෙක කවරේද?**

- හයවන පනත- කාමමිථ්‍යාචාරය නොකරව
- නව වන පනත - පරදාර ආලය නොකරව

**iv. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.**

- ඉච්ඡාභංගත්වය
- අනුමානය

**v. ආගමන සමයේ සහ නත්තල් සමයේ ජනවන්දනා මෙහෙයන්හි දී භාවිතා කරන වර්ණ දෙක පිළිවෙලින් ලියන්න.**

- ආගමන සමයේ - දම් වර්ණය
- නත්තල් සමයේ - සුදු වර්ණය

**vi. පංච පුස්තකය සකස් වී ඇත්තේ කුමක කරුණු දෙකක් පදනම් කරගෙනද?**

- පරම්පරාගත විශ්වාසය
- අත්දැකීම්

**vii. යාවේ සම්ප්‍රදායේ (J) ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

- දෙවියන් වහන්සේව යාවේ නමින් ආමන්ත්‍රණය කිරීම
- කතාන්දර ශෛලය
- විවිධත්වයකින් යුක්තවීම
- සරල හා පැහැදිලි භාෂාවකින් යුක්තවීම
- නාට්‍යමය ස්වරූපය
- චිත්තරූප මවා ගත හැකිවීම

**viii.** **පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.**

- කීකරුකම
- පූජක බඹසර

**ix.** **පුන්‍ය ක්‍රියා දෙවර්ගය නම් කරන්න.**

- ආත්මික පුන්‍ය ක්‍රියා
- ශාරීරික පුන්‍ය ක්‍රියා

**x.** **කතෝලික සභා ධර්මෝපදේශයට අනුව භාවනාව යනු සොයා යාමක් බැවින් මෙම සොයා යාමේදී විමසිලිමත් විය යුතු කරුණු දෙක සඳහන් කරන්න.**

- කිතුනු ජීවිතයේ පරමාර්ථ
- කිතුනු ජීවිතය ගත කළ යුතු ආකාරය

**2. අභිමතාර්ථ: ශුද්ධවූ ජුසේවාස් මුනිඳුන්ගේ දූත සේවයේ ඇති මහඟු ගුණාංග තුළින් අපේ ජීවිත පැවැත්ම හැඩගස්වා ගැනීම.**

**ලකුණු:** $(1)\ \frac{2}{2} + (2)\ \frac{3}{3} + (3)\ \frac{5}{5} = \frac{10}{10}$

**i.** **ශුද්ධ වූ ජුසේවාස් පියතුමා විසින් දේවස්ථාන සේවය සඳහා ගිහියන් අතුරෙන් පත් කළ නායකයින් දෙවර්ගයක් නම් කරන්න.**

- අන්නාවි
- මුහුප්පු
- සන්ක්‍රිස්තියන්

**(ලකුණු 02 යි)**

**ii.** **කෝට්ටේ රාජ්‍යය පෘතුග්‍රීසි පාලනයට නතුවීමත් සමග මෙරට සේවය සඳහා පැමිණි වෙනත් පැවිදි නිකායන්ට අයත් ධර්මදූත කණ්ඩායම් තුන නම් කරන්න.**

- ජේසු නිකායේ ධර්මදූතවරු
- දොමිනිකාන නිකායේ ධර්මදූතවරු
- අගොස්තීනු නිකායේ ධර්මදූතවරු

**(ලකුණු 03 යි)**

**iii.** **ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ සේවය තුළින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පහක් විස්තර කරන්න**

- ප්‍රසාද ස්නාපනයෙන් අප ලද කැඳවීම තුළ, අභියෝග හමුවේ වුවද ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව ධර්මය ප්‍රචාරය කිරීම.
- අන් අයගේ අවශ්‍යතා හමුවේ අප ලද හැකියාවන් දක්ෂතාවයන් අනුව සේවය සැලසීම.
- ඉතා අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට පුරුදුවීම.
- දේව වචනය අනුව ජීවත්වීම හා ක්‍රියා කිරීම.
- පවුලක් ලෙස එක්ව සැමදාම දෙව් පියාණන්ට යාච්ඤා කිරීම.
- දේව මෙහෙයන්ට සහභාගිවීම, දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගනිමින් ජීවමාන ස්වාමීන් වහන්සේට සාක්ෂි දැරීම.
- කුඩා කල පටන් ම අන් අය වෙනුවෙන් කැප වන්නටත්, අන් අයගේ අවශ්‍යතා ඉටු කරන්නටත් ඉදිරිපත්වීම.
- දහම්සේවා කටයුතුවලට සම්බන්ධවීම හා සමිති සමාගම් තුළ ක්‍රියාකාරීව කටයුතු කිරීම.
- එතුමාමෙන් සැමවිට දෙවිඳුන් තුළ යැපීම.

**(මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු 05 ලබා දෙන්න)**

**3. අභිමතාර්ථ: උතුම් වූ දිව්‍ය පූජාව කිතුනු දිවියේ කේන්ද්‍රය කර ගනිමින් අර්ථාන්විතව හා ක්‍රියාකාරීව සහභාගිවීමේ අවශ්‍යතාව හා මඟ පෙන්වීම ලබා ගැනීම.**

**ලකුණු: (1) $\frac{2}{2}$ + (2) $\frac{3}{3}$ + (3) $\frac{5}{5}$ = $\frac{10}{10}$**

**i. දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත දෙකක් නම් කරන්න**

- නමස්කාරය
- පූජාසනය සිපාචාරය
- සුවද දුම්
- දල්වන ලද පහන්

**(මේවායින් දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි)**

**ii. පඬුරු පිදීමේ පරමාර්ථ තුන ලියන්න**

- පූප සහ මිදියුස ගෙන ඒම
- දුගී දුප්පත් අයට දිය හැකි පඬුරු ගෙන ඒම
- ශුද්ධවූ සභාවේ නඩත්තුව සඳහා පඬුරු පිදීම
- දිව්‍ය පූජාවේ ආරම්භක ගීතිකා ඇතුළු ගීතිකාවලට ගායනයෙන් සහයවීම හා ප්‍රකාශනවලට පිළිතුරුදීම
- ස්තෝත්‍ර යාගික යැදුමට සහභාගිවීම

**(කරුණු තුනකට ලකුණු 03 යි)**

**iii. ඉරුදින දිව්‍ය පූජාවට අර්ථාන්විතව හා ක්‍රියාකාරීව සහභාගිවීම සඳහා ඔබ ගන්නා පියවර කරුණු පහකින් විස්තර කරන්න.**

- පවුලක් ලෙස දිව්‍ය පූජාව ආරම්භ කිරිමට පෙර දේවස්ථානයට යාම හා අවසන් ආශිර්වාදයෙන් පසු දේවස්ථානයෙන් පිටත්ව යෑම.
- දිව්‍ය පූජාවේ යාච්ඤා වලට ගාම්භීරව හා අර්ථාන්විතව පිළිතුරු ලබාදීම.
- අපගේ පාප වලට සැබෑ ලෙස මනස්ථාප වීමෙන් අනතුරුව ශබ්ද නගා ක්‍රියාකාරී ලෙස දිව්‍ය පූජාවට සහභාගීවීම.
- ශුද්ධවූ දේව වචනයට සවන් දී ඒ අනුව ජීවිතය නිවැරදිව හැඩ ගස්වා ගැනීම හා එදින ශුද්ධවන්තව ගත කිරීම.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගෙන ගෞරවාන්විතව පැමිණ අපගේ අවශ්‍යතා ජීවමාන ක්‍රිස්තුන් වහන්සේට ප්‍රකාශ කිරීම හා අපගේ හදවතට වැඩම කිරීම වෙනුවෙන් ස්තුති කිරීම, ඉදිරි සතිය ස්වාමින් වහන්සේ සමඟ ජීවත් වීමට අදිටන් කර ගැනීම.
- ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණිවිඩය අපගේ එදිනෙදා ජීවිතය තුළ ජීවත් කර වන්නට හා සෑම දෙනා සමගම සාමය, සහෝදරත්වය, එකමුතුකම පෙර දැරි කර ගනිමින් වෙසෙන්නට ආශිර්වාද පැතීම.

**(මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 05 යි)**

4. අභිමතාර්ථ: දේව වචනයට සාක්ෂිදැරූ දිවැසිවරුන් මෙන් වර්තමානයේ අප කැඳවීම තේරුම් ගනිමින් දිවැසිකාර්යයේ යෙදීම හා දේව වචනය ප්‍රචලිත කිරීම.

ලකුණු: (1) $\frac{2}{2}$ + (2) $\frac{3}{3}$ + (3) $\frac{5}{5}$ = $\frac{10}{10}$

i. ලේඛක දිවැසිවරු බෙදා වෙන් කරන කොටස් දෙක කුමක්ද?
- ප්‍රධාන දිවැසිවරු
- සුළු දිවැසිවරු

(ලකුණු 02 යි)

ii. දිවැසිවැකි කීමේදී යෙසායා, ජෙරමියා හා එසකියෙල් දිවැසිවරුන් භාවිත කරන තුන් ආකාර පද මාලාව සඳහන් කරන්න
- "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක"
- "මෙසේ වදාරණ්නේ සමිඳාණන් වන මමය"
- "සමිඳාණන් වහන්සේගේ පණිවිඩය ...... වෙත පැමිණියේය"

(ලකුණු 03 යි)

iii. ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලැබූ දිවැසිවර කැඳවීමට සාක්ෂි දරන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න
- දේව වචනයේ පණිවිඩ කරුවෙකු ලෙස කටයුතු කිරීම.
- දේව වචනයට පිටුපා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දීම.
- ධර්මදාන කටයුතුවලට සහයවීම.
- සත්‍යය ප්‍රකාශ කිරීම හා ඒ අනුව ජීවත්වීම.
- දෙවි පියාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින දේවස්ථානය තුළ භක්තිවන්තව හැසිරීම.
- දහම් පාසල් සේවයේ කටයුතුවලට සහයවීම.
- ජෙරමියා දිවැසිවරයා මෙන් අපත් අපගේ දුබලකම් තුළ දෙවියන් වහන්සේ අපට දෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීමට ස්වාමින් වහන්සේගෙන් බලවත් වීම.
- අප ලද කැඳවීම වෙනුවෙන් දෙවි පියාණන් වහන්සේට ස්තුති කිරීම.

(මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 05 ලබා දෙන්න)

5. අභිමතාර්ථ:දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම හා පූජකවරයේ දේව ප්‍රසාද නිධානය තුළින් සිදුවන සේවයේ වැදගත්කම අවබෝධ කිරීම.

ලකුණු: (1) $\frac{2}{2}$ + (2) $\frac{3}{3}$ + (3) $\frac{5}{5}$ = $\frac{10}{10}$

i. පූජාප්‍රසාදිවරු දෙවර්ගය නම් කරන්න
- පදවි පූජක
- පැවිදි පූජක

(ලකුණු 02 යි)

**ii. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක තුළින් ඉටුවන විශේෂ කාර්යය තුනක් සඳහන් කරන්න**

- ධර්මදූත මෙහෙවරක් පැවරෙයි
- දේව ජනතාව ගොඩනගයි
- අන් අයගේ ගැළවීම තුළින් තම ගැළවීම සලසා ගැනීම

**(ලකුණු 03 යි)**

**iii. දේව කැඳවීමක් අපේක්ෂාවෙන් සිටින ඔබගේ මිතුරෙකු/මිතුරියක දිරිගැන්වීම සඳහා කෙරෙන යෝජනා කරුණු පහකින් විස්තර කරන්න**

- ප්‍රසාද ස්නාපනයෙන් ලැබූ ත්‍රිවිධ කැඳවීම් අනුව දේව සේවය සඳහා ඉදිරිපත්වීම භාග්‍යයක්බව පෙන්වාදීම.
- දහසක් අතරින් දුබල වූ ඔබව දෙවියන් වහන්සේ විසින් තෝරා ගෙන ඇත්තේ ඔබට ඇති විශේෂ ආදරය නිසා බව.
- ජේසුස් වහන්සේ මෙලොව ජීවිත කාලයේදී සිය ශ්‍රාවකයින් ලෙස තෝරාගත් අයට විශේෂ වරප්‍රසාද ලබාදුන් බව.
- දේව කැමැත්ත අනුව දේව කැඳවීම තෝරා ගැනීම ඔබ තුළ ඇති ශුද්ධාත්ම මඟ පෙන්වීම මත සිදුවී ඇති බව.
- ස්වාමීන් වහන්සේ මෙන් තම ජීවිතය ජනතා සේවය සඳහා කැප කිරීමට එකඟවීම තමන්ට මෙන්ම අන් අයටද ආශිර්වාදයක් බව.
- සැම විටම දෙවිඳුන් තුළ යැපීම හා උන්වහන්සේගේ කැමැත්තට අවනතවීම
- දේව කැඳවීම තෝරා ගෙන අභියෝග හමුවේ නොබියව කටයුතු කිරීමට අවශ්‍ය වරම් ඉල්ලා අප ද යාච්ඤා කරන බව.

**(මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු 05 යි)**

**6. අභිමතාර්ථ: මරියතුමිය වෙත අප දක්වන ගෞරවය, භක්තිය තවත් වර්ධනය කිරීම හා එතුමියගේ මධ්‍යස්ථභාවය ලබා ගැනීමේ අවශ්‍යතාවය තහවුරු කිරීම.**

**ලකුණු: (1) $\frac{2}{2}$ + (2) $\frac{3}{3}$ + (3) $\frac{5}{5}$ = $\frac{10}{10}$**

**i. ජනවන්දනා වර්ෂය තුළ මරියතුමියට ගෞරව පූද කිරීමට ශුද්ධ වූ සභා මාතාව පවත්වන ණය මංගල්‍ය දෙකක් සඳහන් කරන්න.**

- ජනවාරි 01 පාරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය
- අගෝස්තු 15 මරියතුමියගේ ස්වර්ගාරෝපණවීමේ මංගල්‍යය
- දෙසැම්බර් 08 දේව මෑණියන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය

**(ලකුණු 02 යි)**

**ii. මරිය වහන්සේගේ දර්ශනයවීම් පසුබිම් වී ඇති ඇති ලෝක ප්‍රකට සිද්ධස්ථාන තුනක් නම් කරන්න**

- පාතිමා නුවර
- ලූර්දු නුවර
- වේලක්කන්නි නුවර

**(මරිය වහන්සේගේ දර්ශනයවීම් ඇතුළත් ලෝක ප්‍රකට සිද්ධස්ථාන තුනක් නිවැරදිව නම් කර ඇත් නම් ලකුණු 03 යි)**

iii. **මරිය වහන්සේගේ විශ්වාසයේ ජීවිතය ආදර්ශයට ගෙන විශ්වාසයෙන් ඈත් වී යන ඔබේ මිතුරෙකුට දිය හැකි අවවාද පහක් විස්තර කරන්න.**

- ජේසුස් වහන්සේ කුරුස ගසේ දී සිය මෑණියන් වන මරියතුමිය තමන් ප්‍රේම කළ ශ්‍රාවකයා මගින් අප සැමව භාරදුන් බව.
- එතුමිය සිය මුළු ජීවිතයට ජේසුස් වහන්සේ වෙනුවෙන් කැප කිරීම හා උන් වහන්සේගේ මරණින් පසුව ද ශුද්ධාත්මයාණන් වඩින තුරු ශ්‍රාවකයින් සමග ජීවත්වීම හා මඟ පෙන්වීම.
- මරියතුමිය ජේසුස් වහන්සේගේ මාතාව මෙන්ම සාන්ත සභාවේ ද මාතාව ලෙස පිළිගැනීම.
- අපගේ දුර්වලතාවයන් හා පාපයට නැඹුරුවීමේ ප්‍රවනතාවලදී එතුමිය අප වෙනුවෙන් මැදිහත්වීම.
- අපගේ අවශ්‍යතා අපට පෙර හඳුනාගෙන තම පුතුන් ඉදිරියේ අප වෙනුවෙන් මැදිහත් වී එය ඉටු කරදීම.
- අපගේ ජීවිතවල දුෂ්කර කාලවලදී එතුමියගේ මාතෘක ප්‍රේමය විශේෂ ආකාරයකින් අපවෙත ලබා දෙන බව.

**(මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු 05 යි)**

7. **පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.**

(1) පොරොන්දු හා බාරහාර
(2) ආත්මීක මව්පියන්ගේ වගකීම
(3) වතාරික සමය
(4) කතෝලික දහම් පාසල

**ලකුණු: (1) $\frac{5}{5}$ + (2) $\frac{5}{5}$ = $\frac{10}{10}$**

i. **අභිමතාර්ථ: දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතය ක්‍රියාත්මක කරන ආකාරය සොයා බැලීම.**

❖ පොරොන්දු හා බාරහාර

- කතෝලික අපගේ විශ්වාසයේ ජීවිතය ක්‍රියාවට නැංවීමේදී අපගේ භක්තියේ කොටසක් ලෙස පොරොන්දු හා බාරහාර සඳහා යොමු වෙති.
- අපට මුහුණදීමට සිදුවන ප්‍රශ්න වලදී සාන්තුවරයන්ගේ මැදිහත්කම මගින් දෙවියන් වහන්සේට බාර වෙන අවස්ථා දක්නට ලැබේ.
- අපගේ එදිනෙදා කරන යාච්ඤා වලට අමතරව යාච්ඤාවක් කීමට, ඉටි පහන් දැල්වීමට, දාන දීමට, විශේෂ වන්දනා ගමනක් යාමට අපි ඇතැම් විට බාර වෙමු.
- මෙම බාර ඉටු කිරීම දෙවියන් වහන්සේට කරන ගරුබිය පැමකි, ප්‍රේමය දැක්වීමකි.
- තවද ජීවිතයේ විවිධ අවස්ථාවලදී දෙවියන් වහන්සේට පොරොන්දු දීමට කතෝලිකයින් වන අපව කැඳවනු ලබයි.
- ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, ආශිර්වාදකාර බන්ධනය හා පූජකවරය යන සක්‍රමේන්තු ලබා ගැනීමේදී පොරොන්දු දිය යුතු වන්නේය.
- මෙම බාරහාර හා පොරොන්දු ඉටු කිරීම දෙවියන් වහන්සේට දක්වන ගෞරවයේ හා ප්‍රේමයේ සලකුණක් ලෙසද සැලකිය හැකිය.

**(ලකුණු 05 යි)**

**ii. අභිමතාර්ථ: ජනවන්දනා වර්ෂයේ චතාරික සමය තුළ සමරන දේව අභිරහස් ජීවත් කරවන ආකාරය ක්‍රියාවට නැංවීම.**

❖ **චතාරික සමය**

- අළු බදාදා සිට මහා බ්‍රහස්පතින්දා දක්වා විහිදෙන චතාරික සමය විවිධ ලෙස අර්ථකථනය කරනු ලැබ ඇත.
- ප්‍රසිද්ධ ජීවිතය අරඹන්නට පෙර ජේසුස් වහන්සේ පාළුකරයේ ගත කළ යාච්ඤාවේ හා මර්ධන ජීවිතයට සමවැදෙන කාලයකි.
- පසුතැවිල්ලේ, ආත්ම පරිත්‍යාගයේ හා ජීවිත වෙනසක් ඇතිකර ගැනීමේ කාලයකි.
- අපගේ ප්‍රසාද ස්නාපනීය ජීවිතය නවතාවයකට පත්කරන කාලයකි. එනම් පාපයට මැරී නව ජීවිතයකට උපත ලැබීමේ කාලයකි.
- ලෞකික ආශාවන්ට, ආත්මාර්ථයට මැරී, දෙවිඳුන් තුළ නිදහස් දරුවන් මෙන් ජීවත්වීමේ කාලයකි.
- මෙම කාලය තුළදී "ආලේලූයියා" "ග්ලෝරියා" (සුරදූත ගීය) ගායනා නොකෙරේ.
- මර්ධන ක්‍රියා කිරීම, දාන ධර්මදීම, අසරණයින්ට පිහිටවීම, සමාවදීම, ශුද්ධවූ පැය හා පාද නමස්කාරය වැනි භක්ති අභ්‍යාසවල නිරතවීමට සාන්ත සභා මාතාව අපට ඇරයුම් කරයි.
- වැඩිහිටි ප්‍රසාද ස්නාපනය ලැබීමට අපේක්ෂාවෙන් සිටින්නන්ව සූදානම් කරන අවසාන කාලය වන්නේ චතාරික සමයයි.

**(ලකුණු 05 යි)**

**iii. අභිමතාර්ථ: ආත්මීක මව්පියන් ලෙස වරප්‍රසාද ක්‍රියාවට නංවන ආකාරය මැන බැලීම.**

❖ **ආත්මීක මව්පියන්ගේ වගකීම්**

- ආරම්භක දේව ප්‍රසාද නිධාන ලබා තිබීම මෙන්ම ඒ අනුව තම ජීවිත ස්වාමීන් වහන්සේ මත යැපීම.
- සමාජයේ පැවැත්ම හා යුතුකම් වගකීම් ගැන අත්දැකීම් ලබා උපදෙස් දීමට හැකිවීම.
- තමන්ගේ විශ්වාසය ජීවත් කරවන හා තමන්ගේ කාර්යභාරය ගැන අවබෝධයෙන් කටයුතු කිරීම.
- දරුවාගේ දෙමාපියන් මෙන් ආත්මීක අවශ්‍යතාවලදී දරුවා වෙනුවෙන් මැදිහත්වීම - මඟ පෙන්වීම.
- දරුවා වෙනුවෙන් තමන් ඉටුකළ යුතු වගකීම් ගැන මනා අවබෝධයෙන් කටයුතු කිරීම.
- දරුවාගේ ඉදිරි ජීවිතයේදී ඔහු/ඇය ප්‍රසාද නිධාන ලබාදීමට - දහම් පාසල් යැවීම - දිව්‍ය පූජාවට සහභාගි කරවීම, දෙමාපියන් මෙන් වගකීම් දැරීම.

**(ලකුණු 05 යි)**

**iv. අභිමතාර්ථ: කතෝලික දහම් පාසල තුළින් ඉටු කරන ගිහි ධර්මදූත සේවාව පිළිබඳ සිසු ආකල්ප පරීක්ෂා කිරීම.**

❖ **කතෝලික දහම් පාසල**

- දිවැසිවර කාර්යයෙහි ප්‍රධාන දූත සේවාවක් වන්නේ ධර්මදානයයි. (ක.ස.ධ. 905). ධර්මදානය පූජක හා පැවිදි අයගේ පමණක් නොව ගිහියන්ගේද දිවැසිවර කාර්‍යයකි. (ක.ස.ධ. 904).
- එබැවින් කුසලතාව ඇති හා මනා පුහුණුව ලද ගිහි ජනතාවට ධර්මෝපදේශ කාර්යයෙහි ද දේව ධර්ම ශාස්ත්‍රයන් ඉගැන්වීමෙහි හා ප්‍රචාරක මාධ්‍යයන් භාවිතයෙහිදී ද සහයෝගීව ක්‍රියා කළ හැකිය (ක.ස.ධ. 906).
- ඒ අනුව දහම් පාසල කිතුනුවාට පොදු පූජකවරය තුළින් ලැබෙන දිවැසිවර කාර්යෙහි නිරතවීමට තෝතැන්නක් වනු ඇත.
- ක්‍රිස්තු ආකල්ප දරුදැරියන්ගේ හදවත් තුළ ජනිත කිරීම දහම් පාසල තුළින් ඉටු වන කාර්යකි.
- ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොව ආරම්භ කරන ලද සේවාව නොකඩවා පවත්වා ගෙන යෑම තුළින් මිහිපිට දේව රාජ්‍යය පතල කිරීම දහම් පාසල තුළින් ඉටු වේ.
- සාර ධර්ම වලින් පිරිපුන් ගුණාත්මක ආකල්ප සංවර්ධනයකින් යුත් කතෝලික දරු දැරියන් පුරුදු පුහුණු කරන තෝතැන්නකි.

**(ලකුණු 05 යි)**

**(ඉහත එක් කෙටි පිළිතුරක් සඳහා කරුණු 5 ක්වත් තිබේ නම් උපරිම ලකුණු ලබා දෙන්න)**